PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2023-01-05

සභාපතිතුමා,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

සභාපතිතුමනි,

**පළාත් පාලන මැතිවරණය 2023**

පළාත් පාලන මැතිවරණය පිළිබඳව තීන්දු ගැනීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය, පොලිස් දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණාලය, දේශපාලන පක්ෂ ආදී පාර්ශව සමග සාකච්ඡා කර තීන්දු ගත යුතු බවට දේශපාලන පක්ෂ විසින් සමාජ මතයක් නිර්මාණය කරමින් සිටියි.

එමෙන්ම ඡන්ද පත්‍රිකා ඇතුලු මුද්‍රණ කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය නොමැති බවටද මාධ්‍ය හරහා වාර්තාවී ඇත.

මෙවැනි මාධ්‍ය වාර්තා නිවැරදි විය නොහැකි වුවද මැතිවරණ කොමිෂන් සභාව පිළිබඳව හා එහි ක්‍රියාවලිය පිළිබඳව මහජන විශ්වාසය ආරක්ෂා විය යුතු බව අප තරයේ විශ්වාස කරන බැවින් ඉහත කරුණු පිළිබඳව ඔබ කොමිෂන් සභාවේ අදහස් හා අදාල පාර්ශව සමග ඔබ සාකච්ඡා කලේද යන්න පිළිබඳ අප දැනුවත් කරන්නේ නම් කෘතඥ වෙමි.

එමෙන්ම මෙවර අයවැය හරහා පළාත් පාලන මැතිවරණයට වෙන් කර ඇති මුදල් ලබාදීමට නොහැකි බවටත් ඒ පිළිබඳව ගැටලු ඇති බවටත් අදාල පාර්ශවයන් විසින් කිසියම් නිල දැනුවත් කිරීමක් කර තිබේද යන්න පිළිබඳව වැඩිදුරටත් අපව දැනුවත් කරන්නේ නම් බෙහෙවින් කෘතඥ වෙමි.

ස්තුතියි,

මෙයට,
විශ්වාසී,



රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ

පිටපත
කොමසාරිස් ජනරාල්තුමා, මැතිවරණ කොමිෂන් සභාව, සරණ මාවත, රාජගිරිය.

# No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2 558 570 / 11 2 558 571 Fax: (+94) 11 2 558 572
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk